**ශීර්ෂය 260- නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 260 - නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 මැයි 30 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 546.00 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 523.11 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 22.89 ක් හෙවත් සියයට 4.19 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 447.00 | 439.65 | 7.35 | 1.64 |
| මූලධන | 99.00 | 83.46 | 15.54 | 15.70 |
| **එකතුව** | **546.00** | **523.11** | **22.89** | **4.19** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත අමාත්‍යාංශ 22 ක් හා දෙපාර්තමේන්තු 20 ක් විසින් එකතුව රු.මිලියන 1,882.44 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,727.57 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 154.87 ක් හෙවත් සියයට 8.23ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 26001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 32.00 | 31.95 | 20.00 | 23.13 | 94.00 | 74.66 |

## 2.3 අග්‍රිම ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ අංක 7002/0000/00/0307/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 1.1 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 05 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 233.84 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0047/000 | 0.91 |
| 6000/0000/00/0002/0063/000 | 0.84 |
| 6000/0000/00/0016/0016/000 | 122.38 |
| 6000/0000/00/0017/0003/000 | 73.37 |

| | |
|---|---|
| 6000/0000/00/0018/0019/000 | 36.34 |
| | --------- |
| **එකතුව** | **233.84** |
| | ===== |

**2.5 විගණන නිරීක්ෂණය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ.**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.

**3.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නුවරඑළිය තැපැල් කාර්යාලයේ වහලය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.4,142,025 ක කොන්ත්‍රාත් වටිනාකමක් මත අදියර 03 ක් යටතේ ඉටු කිරීමට ගොවි සමිතියකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ගිවිසුමකට එළඹ තිබුණි. කොන්ත්‍රාත්තුව ඉටුකිරීම සඳහා තැපැල් දෙපාර්තමේන්තුව විසින් රු.4,142,025 ක් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් වෙත ලබාදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුළු කොන්ත්‍රාත් වටිනාකම සැලකිල්ලට ගෙන ලංසු කැඳවීමෙන් කොන්ත්‍රාත්කරුවෙකු තෝරා නොගෙන කොන්ත්‍රාත්තුව අදියර 3 ක් යටතේ ප්‍රභේදනය කර ලියාපදිංචි සමිතියට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

(ii) 2014 ඔක්තෝබර් 20 දින පළමු අදියර සඳහා කොන්ත්‍රාත්කාර සමිතිය සමඟ ගිවිසුම අත්සන් කරන විට එම සමිතියේ බැංකු ගිණුමේ රු.1,596 ක් වූ ශේෂයක් පමණක් තිබියදී ඒ කෙරෙහි අවධානය යොමු නොකර , අවස්ථා තුනකදී එම සමිතිය සමඟ ගිවිසුම්වලට එළඹ තිබුණි.

(iii) කොන්ත්‍රාත්තුවක් සාර්ථකව ඉටු කිරීමට අවශ්‍ය භෞතික හා මානව සම්පත් ලබා ගැනීමේ හැකියාව කොන්ත්‍රාත්කාර සමිතිය සතුව පවතින බවට අවධානය යොමු නොකර කොන්ත්‍රාත්තුව එම සමිතියට ප්‍රදානය කිරීම නිසා 2016 දෙසැම්බර් 31 දින වන විටත් කර්මාන්තය ඇස්තමේන්තුව පරිදි නිමකිරීමට නොහැකි වී තිබුණි.

(ආ) 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක් විසින් එකතුව රු. 9,725,568 ක් වැයකර ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 24 ක් ඇස්තමේන්තුවල සඳහන් කාල පරිච්ඡේදයන් තුළ නිම නොකිරීම නිසා ඒවා මහජනයාගේ ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක් විසින් එකතුව රු.45,968,553 ක් වැයකර ඉදි කරන ලද ව්‍යාපෘති 52 ක් ඇස්තමේන්තු පරිදි නිම කර තිබුණි. නමුත් මහජනයාගේ ප්‍රයෝජනයට ගැනීමට හැකි වන පරිදි ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හා ඉතිරි වැඩ නිම කර ගැනීම සඳහා නැවත ප්‍රතිපාදන නොලැබීම නිසා එම ව්‍යාපෘති මහජනයාගේ ප්‍රයෝජනයට ගැනීමට නොහැකිවී තිබුණි.

(ඈ). 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ එකතුව රු.14,159,693 ක් වටිනා කර්මාන්ත 20 ක් ඇස්තමේන්තු පරිදි වැඩ නිම කර තිබුණද, විවිධ හේතුන් මත එම කර්මාන්ත අසාර්ථක වී තිබුණි.

(ඉ) 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා එකතුව රු.10,475,823 ක් වැයකර ඉදිකරන ලද ව්‍යාපෘති 09ක් විවෘත නොකිරීම නිසා හෝ වෙනත් හේතුන් මත 2017 මාර්තු 31 දින වන විටත් ඌන උපයෝජිතව පැවතුණි.

(ඊ) නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක් විසින් එකතුව රු.10,749,393 ක් වැයකර ව්‍යාපෘති 10 ක ඉදිකිරීම් කටයුතු නිම කර තිබුණි. එම ඉදිකිරීම්වලින් පසු කිසිදු නඩත්තු කිරීමක් සිදු කර නොතිබුණි.

(උ) 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2 ක් විසින් එකතුව රු.7,131,375 ක් වැයකර ක්‍රීඩා පිටි ඉදිකිරීම හා විවිධ ගොඩනැගිලි වටා දැල් ආවරණ කිරීම් සිදුකර තිබුණි. එම ඉදිකිරීම් ගොඩනැගිලි සම්මත රේටය අනුව සිදු කර නොතිබුණු අතර, දැල් ආවරණ කිරීම් ප්‍රමිතියෙන් තොරව සිදු කළ අවස්ථා 07 ක් නිරීක්ෂණය විය.

(ඌ) නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක් විසින් රු.1,397,832 ක් වැයකර ඉදි කළ ගොඩනැගිලිවල වහල සඳහා 62x62x6 mm කෝණ යකඩ වෙනුවට ඊට වඩා අඩු ප්‍රමාණයෙන් යුතු කෝණ යකඩ භාවිතා කර ගෙවීම් කළ අවස්ථා 06ක් නිරීක්ෂණය විය.

(එ) 1:2:4 මිශ්‍රණය සඳහා 19 mm කැටගල් භාවිතා කළ යුතු වුවත්, ඒ සඳහා 25 mm කැටගල් හෝ 37.5 mm කැටගල් භාවිතා කරන්නේ නම් 1: 2 ½ : 5 හෝ 1:3:6 කොන්ක්‍රීට් මිශ්‍රණ රේටය අනුව ගෙවීම් කළ යුතුය. නමුත් 25 mm සහ 37.5 mm කැටගල් යොදා මාර්ග නිම කිරීමේ අවස්ථා 14 ක දී 1:2:4 කොන්ක්‍රීට් මිශ්‍රණයේ රේටය අනුව ගෙවීම් කිරීම හේතුවෙන් රු.1,483,605 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඒ) 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක ඉදිකිරීම් පරීක්ෂා කිරීමේදී අවස්ථා 51 ක දී ඉටු කර නොතිබුණු වැඩ සඳහා එකතුව රු.8,018,905 ක ගෙවීම් හා අධිගෙවීම් සිදු කර තිබුණි.

(ඔ) මාර්ග ඉන්ටර්ලොක් ගල් ඇතිරීමේදී නියමිත ප්‍රමිතියෙන් යුතු කැටගල් යොදා නොගැනීම, කැටගල් රසායනාගාර පරීක්ෂාවකට ලක් නොකිරීම , මාර්ගය නිසි පරිදි තැලීම් නොකිරීම ආදී හේතුන් නිසා 2016 දෙසැම්බර් 31 දින වන විට ගිලා බැසීම්වලට ලක්වූ, දෙපස කොන්ක්‍රීට් ආවරණ විනාශ වී ගිය හා මාර්ගය කැඩී බිඳීගිය අවස්ථා 07 ක් සිදුවී තිබුණි. එවැනි අවස්ථා 07 ක් වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක් විසින් එකතුව රු. 6,785,584 ක් ගෙවා තිබුණි.

(ඕ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක කාර්මික නිලධාරීන් විසින් කර්මාන්ත භෞතිකව පරීක්ෂාවකට ලක්කර නොතිබුණි. කර්මාන්තයට අදාළ බිල්පත් කර්මාන්තය සඳහා වන ඇස්තමේන්තුව අනුව සසඳා අවස්ථා 25 කට අදාළ ගෙවීම් අනුමත කර තිබුණි. එම මිනුම් භෞතිකව ක්ෂේත්‍රයේ හඳුනා ගැනීමට නොහැකි විය. එම ව්‍යාපෘති සඳහා එකතුව රු.14,315,576ක් ගෙවා තිබුණි.

(ක) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක් විසින් ඇස්තමේන්තු සකස් කිරීමේදි ගොඩනැගිලි සම්මත රේට, මාර්ග සම්මත රේට සැලකිල්ලට නොගෙන විශේෂ රේට (SSR) සකස් කර ගෙවීම් කළ අවස්ථා 07 ක් සහ BSR රේට වෙනුවට යන්ත්‍ර පැය සඳහා ගෙවීම් කළ අවස්ථා 02 ක් සඳහා එකතුව රු. 2,963,566 ක් ගෙවා තිබුණි.

(ග) 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ඉදිකර තිබූ ගොඩනැගිලි ගණනාවක් සඳහා යොදන ලද තලාද පුපුරා තිබුණි. එම ගොඩනැගිලිවල පැවැත්ම පිළිබඳ ගැටළු මතුකළ අවස්ථා 07 ක් සඳහා හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකතුව රු.7,895,250 ක් වැය කර තිබුණි.

(ජ) කර්මාන්තයක් ආරම්භ කිරීමට පෙර එම ඉදිකිරීම් කරන ස්ථාන හිමිකරුවන්ගේ අවසරයක් ලබා ගැනීමෙන් තොරව රජයේ ඉදිකිරීම් සිදු කර තිබුණු අවස්ථා 04 ක් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3 ක් විසින් එකතුව රු.3,473,942 ක් ගෙවා තිබුණි.

(ට) හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රජයේ අනුමත නොවූ අමුද්‍රව්‍ය යොදා ගෙන අවස්ථා 03 කදී සිදුකළ ඉදිකිරීම් සඳහා එකතුව රු.1,249,662 ක් වැය කර තිබුණි.

(ඩ) වලපනේ හා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ICTAD නියමයන්ට අනුව ලබාගත යුතු සියලු අවදානම් පිළිබඳ රක්ෂණ සහතික ලබා ගෙන නොතිබුණු කොන්ත්‍රාත්කරුවන්හට වටිනාකම රු.4,563,065ක් වූ කොන්ත්‍රාත් 05ක් ප්‍රදානය කර තිබුණි.

(ණ) කලුගල් බැම් ඉදිකිරීම සඳහා BSR රේටය අනුව 6"x9" ප්‍රමාණයේ කැටගල් භාවිතා කළ යුතු නමුත්, වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෙන්ලෙනාඩ් විද්‍යාලයේ මාර්ගයේ ආරක්ෂිත බැම්ම ඉදිකිරීමේදි ඊට වඩා විශාල කැටගල් යොදා රු.574,000 ක් ගෙවීම් කර තිබුණි.

(ත) ප්‍රමිතියෙන් තොරව වටපිල හා කාණු යෙදූ අවස්ථා 04 ක් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3 ක් විසින් රු.318,288 ක් වැය කර තිබුණි.

(ද) BSR රේටයට අනුව වැහිපිහිලි යෙදීමේදී වැහිපිහිලි කොකු දෙකක් අතර පරතරය 9" විය යුතු වුවද, පරතරය 10" සිට 2' 6" දක්වා වූ අවස්ථා 02 ක දී වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකතුව රු.91,402 ක් වැය කර තිබුණි.

(න) රජයේ මුදලින් එක් පුද්ගලයකුට හෝ සුලු පිරිසකට ප්‍රතිලාභ අත්වන පරිදි අඹගමුව හා හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් කර්මාන්ත නිම කළ අවස්ථා 03 ක් සඳහා එකතුව රු.1,079,000 ක් වැය කර තිබුණි.

(ප) 2016 වර්ෂයේ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ශාන්තිපුර වැව අසල පාලම ඉදිකිරීම සඳහා රු.1,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට රු.963,975 ක් වැය කර තිබුණි. ඉදිකිරීම් කරගෙන යාමේදී පාලමේ කොන්ක්‍රීට් තට්ටුව සඳහා යොදා ඇති සැටලිමේ මුක්කු නිසි පරිදි යොදා නොතිබීම හේතුවෙන් ඒවා ගිලා බැස තිබුණද, සැටලිම නිවැරදි කිරීමකින් තොරව කොන්ක්‍රීට් යොදා තිබුණි. යොදා ඇති

කොන්ක්‍රීට්වල කැටගල්, වැලි හා සිමෙන්ති නිසි පරිදි මිශ්‍ර වී නොතිබුණු අතර, කැටගල් වෙන්වී තිබුණි.

(ඛ) නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රුවන්එළිය පල්ලිය පාර සංවර්ධනය සඳහා රු.1,000,000 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර, 2016 දෙසැම්බර් 31 දින වන විට රු.952,655 ක් ගෙවීම් කර තිබුණි. මාර්ග සතිය වෙනුවෙන් නව මාර්ගයක් කැපීමේදී යොදා තිබුණු කාණුවේ කොටසක් 2017 මාර්තු 15 දින වන විට කඩා තිබුණි.

(ම) නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2016 වර්ෂයේදී වින්ඩි කෝනර් දෙවන පටුමඟ සංවර්ධනය යටතේ රු. 491,406 ක් වැය කර ඉදිකර තිබූ මාර්ගය සම්පූර්ණයෙන් විනාශ වී තිබුණි.

(ය) හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පුස්සලමංකඩ මාඔය කොස්වත්ත ගමමැද මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රු.980,000 ක් වැය කර තිබූ අතර, මාර්ගයේ පළල ප්‍රමාණවත් නොවීම හේතුවෙන් කොන්ක්‍රීට් කුලුනු හා තලාද යොදා ඒ මත කොන්ක්‍රීට් කර මාර්ගය පළල් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම මාර්ගය වාහන භාවිතයට යොදා ගෙන නොතිබුණි. මාර්ගය තවත් 400m ක පමණ කොටසක් පෙර පරිදි කොන්ක්‍රීට් කුලුනු මත ඉදිකළ පසු මාර්ගය වාහන ධාවනයට යොදා ගැනීමේ හැකියාව පැවැතුණි. නමුත්, ඉදිකර තිබූ කොටසේ කොන්ක්‍රීට් කුලුනු මත යොදා තිබූ තලාදවල ඝනකම 3" පමණක් වූ අවස්ථා පැවැතුණු අතර, ඒ සඳහා 9" ඝනකමට තලාද යෙදූ බව ඇස්තමේන්තු කර ගෙවීම් කර තිබුණි. යොදා තිබූ කොන්ක්‍රීට් නිසි පරිදි තැලීම් කර නොතිබුණි.

## 3.3 අග්‍රිම ගිණුම්

-------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර ශේෂය හා දෙපාර්තමේන්තු පොත් අතර වූ රු.1,098,856 ක වෙනසට හේතු හඳුනාගෙන 2017 ජනවාරි මාසයේදී රු.197,978 ක ශේෂ නිවැරදි කර තිබුණද, තවදුරටත් රු.900,878 ක නොපියවූ අග්‍රිම ශේෂයක් විය. කොන්ත්‍රාත්කරුවකුට ගෙවන ලද අත්තිකාරමක් නිරවුල් නොකිරීම නිසා 2016 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුම පියවා ගැනීමට නොහැකි වී තිබුණි. එම අත්තිකාරම අයකර ගැනීමට නීතිමය කටයුතු කරගෙන යනු ලබන බව කාර්යාලය විසින් ප්‍රකාශ කර තිබුණත්, ඒ සම්බන්ධ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) නුවරඑළිය හා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2 ක අවස්ථා 14 කදී එකතුව රු.869,797ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණත්, එම අග්‍රිම පියවීම සඳහා මාස 03 ක සිට මාස 10 ක් දක්වා කාල පරාසයක් ප්‍රමාද කර පියවා තිබුණි.

## 3.4 පොදු තැන්පත් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත හින්දු කටයුතු දෙපාර්තමේන්තුව විසින් හින්දු කෝවිල් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අවස්ථා 3 කදී ලබාදෙන ලද මුදල් සහ යටිතල පහසුකම් ප්‍රවර්ධනය සඳහා 2014 සහ 2015 වර්ෂවලදී ලබා දී තිබූ එකතුව රු.240,733 ක් අදාළ කාර්යය භාරයන් ඉටුනොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ආ) කර්මාන්ත 140 කට අදාළව 2012 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ අතුරුදවුම් ලෙස තැන්පත් කරන ලද රු.4,182,256 ක් අදාළ කර්මාන්ත සතුටුදායක ලෙස නිමකර තිබේද යන්න සොයා බලා අදාළ පාර්ශවයන් වෙත නිදහස් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයෙන් 2015 වර්ෂයේදී ලබාදී තිබුණු රු.2,854,947 ක් ඉටු නොකළ කොන්ත්‍රාත් 8 ක් වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන පසුව 2016 ජනවාරි 27 දින හා 2016 අගෝස්තු 27 දින කාලය අතර තුර ගෙවීම් කර තිබුණි.

(ඈ) හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඉඩම් අත්පත් කර ගැනීම සඳහා පළාත් ඉඩම් කොමසාරිස්ගෙන් 2011 පෙබරවාරි 08 දින රු.5,000,000 ක් ලැබී තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණද, විගණිත දිනය වූ 2016 සැප්තැම්බර් 19 දින වන විටත් වන්දි පරීක්ෂණ කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ඉ) වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2009 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ අවස්ථා 46 කදී තැන්පත් කරන ලද නමුත්, එම මුදල කුමන කාර්යන් සඳහා ලැබී තිබුණු බව සනාථ නොවූ එකතුව රු.1,866,799 ක් නිරවුල් කිරීමට හෝ රාජ්‍ය ආදායමට බැර කිරීමට හෝ කටයුතු නොකර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඊ) 2012 මැයි 24 දිනැති අංක 4/3/1/2001/48 දරන ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය අනුව ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සති 72 ක කාලයක් තුළ අවසන් කළ යුතුව තිබුණි. විවිධ ව්‍යාපෘතින් යටතේ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා 2006 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාල පරාසය තුළ අවස්ථා 81 කදී තැන්පත් කරන ලද එකතුව රු.14,742,598 ක් නුවරඑළිය හා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි.

(උ) වර්ෂ 2 ඉක්මවූ එකතුව රු.6,527,508 ක් වූ තැන්පතු 214 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 26001 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය පරීක්ෂා කිරීමේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2015 ජුනි 05 දින මධ්‍යම පළාත් සභාවට ස්ථාන මාරුවී ගිය නිලධාරියකුගේ රු.143,856 ක් වූ ණය ශේෂය ණයගැති ලේඛනයට ඇතුළත් කර

නොතිබුණි. එම ණය ශේෂය පියවා ගැනීමට 2017 අප්‍රේල් 20 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ii). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 3.7 හා 3.8 වගන්තිවලට අනුව වලපනේ ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරිවරයෙකුට 2016ඔක්තෝබර් මාසයේදී ලබාදෙන ලද රු.219,180 ක ණය මුදල එළඹෙන මාසයේ සිට ආපසු අයකර ගත යුතුව තිබුණද 2016 ,දෙසැම්බර් මාසය වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි

## 3.6 වත්කම් කළමනාකරණය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | වටිනාකම<br>රු. | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජීතව පැවති කාලය |
|---|---|---|---|---|
| (i) | ඉඩම්(හෙක්ටයාර්) | 1.55 | ගණනය කර නැත | හඳුනාගත නොහැක. |
| (ii) | ගොඩනැගිලි | 10 | -එම- | -එම- |
| (iii) | ට්‍රැක්ටර් | 01 | -එම- | -එම- |
| (iv) | වතුර බවුසර් | 01 | -එම- | -එම- |
| (v) | මෝටර් සයිකල් | 22 | -එම- | -එම- |
| (vi) | වාහන | 08 | -එම- | -එම- |

### (ආ) වත්කම් පිළිබඳ වෙනත් නිරීක්ෂණ.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැරණි සම්මන්ත්‍රණ ශාලා ගොඩනැගිල්ල මැතිවරණ දෙපාර්තමේන්තුවේ නියෝග මත 2015 ජනවාරි 09 දින මුද්‍රා තබා තිබුණි. එදින සිට 2017 මාර්තු 31 දින වන විටත් එම ශාලාව නිෂ්කාර්යව පැවතුණි.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ රජයේ නිවාසය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය මාණ්ඩලික නිලධාරීන්ගේ රජයේ නිවාසය 2016 දෙසැම්බර් 31 දින වන විටත් පිළිවෙළින් රු.7,757,842 ක් හා රු.6,408,162 ක් වැය කර ඉදිකර තිබුණි. එම නිවාස 2017 මැයි 02 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණි.

(iii) 2013 හා 2014 වර්ෂවලදී ප්‍රතිලාභීන් වෙත බෙදා දීම සඳහා එකතුව රු.5,628,804 ක් වටිනා භාණ්ඩ හා උපකරණ අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබී තිබුණි. විගණන දිනය වූ 2016 ඔක්තෝබර් 05 දින වන විටත් එම භාණ්ඩ ප්‍රතිලාභීන් වෙත බෙදා දී නොතිබුණි.

(iv) වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගබඩාව තුළ යුනිසෙෆ් ආයතනය මගින් ලබා දී තිබුණු මුළුතැන්ගෙයි උපකරණ කට්ටල, වතුර මෝටර්, සවල්, උදලු, ළදරුවන්ගේ මදුරු දැල්, සාස්පාන් සෙට්, චෙන්සෝ යන්ත්‍ර, මදුරු දැල්, පිගන් හා කෝප්ප ගබඩා කර තිබුණි. ගබඩාව තුළ තිබුණු සියළු භාණ්ඩ නිවැරදිව හඳුනා ගැනීමට නොහැකි විය. අදාළ භාණ්ඩවල භාරකාරත්වය වගකිවයුතු නිලධාරියෙකු වෙත පවරාද, නොතිබුණි.

(v) වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේ ගම නැගුම වැඩසටහන සහ පුර නැගුම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන් සඳහා සවිකිරීමට මුද්‍රණය කර තිබුණු නාම පුවරු 211 ක් අදාළ ස්ථානවල සවි නොකර ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(vi) 2016 වර්ෂයේදී වතු යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා එකක් රු.6,800 බැගින් නාම පුවරු 19 ක් සහ එකක් රු. 5,950 බැගින් නාම පුවරු 141 ක් වශයෙන් එකතුව රු.968,150 ක් වැය කර ලබාගෙන තිබුණි. ඉන් රු.624,750 ක් වටිනා නාම පුවරු 105 ක් බෙදා හැරීමෙන් තොරව ගබඩාවේ රඳවා ගෙන තිබුණි.

(vii) කාර්මික දෝෂයකට ලක්ව 2016 ජනවාරි මාසයේ සිට ධාවනයෙන් ඉවත් කර තිබුණු වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වාහනයක් 2017 ජූනි මාසය වන විටත් අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඈ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

වෙනත් ආයතන සතුව තිබුණු ඇතැම් වත්කම් විධිමත් අනුමැතියකින් තොරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් භාවිතයට ගෙන තිබුණු අවස්ථා නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | වත්කම් අයත්ව තිබුණු ආයතනය | වටිනාකම | කාල පරිච්ඡේදය |
|---|---|---|---|
| | | රු.මිලියන | |
| මෝටර් වාහන | කෘෂිකර්ම අමාත්‍යාංශය | 2.00 | වර්ෂ 12 ක සිට |
| මෝටර් වාහන | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන | 1.00 | වර්ෂ 01 ක සිට |

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2012 වර්ෂයේ සිට මධ්‍යම පරිසර අධිකාරිය වෙත මෝටර් වාහනයක් අවිධිමත් ලෙස මුදා හැර තිබුණි.

**3.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) | මුදල් රෙගුලාසි 137 | 979,730 | අවස්ථා 05 කදී භාණ්ඩ හා සේවා ලබාගෙන ඉන්වෙන්ට්‍රි ලේඛනවල ඇතුළත් කිරීමට පෙර ගෙවීම් අනුමත කර චෙක්පත් ලියා තිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 225 හා 260 | 727,858 | ආදායකයාගේ හා ගෙවන නිලධාරියාගේ අත්සන නොමැතිව අවස්ථා 05 කදී ගෙවීම් කර තිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 237(ආ) | 114,000 | අළුත්වැඩියා කිරීමෙන් පසු නිසිපරිදි අළුත්වැඩියාව සිදුකර ඇති බව යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ හෝ කාර්මික නිලධාරියකුගේ සහතිකයක් ලබා ගැනීමකින් තොරව කොන්ත්‍රාත් ආයතනය විසින් ඉදිරිපත් කර තිබුණ දින රහිත අවිධිමත් බිල් පතකට 2016 අගෝස්තු 16 දින ගෙවීම් කර තිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 1647(ආ) | තක්සේරු කර නැත | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන හා ඒවායේ උපකරණ පිළිබඳව පූර්ණ සමීක්ෂණයක්ද, වාහනයේ ආරක්ෂාව එක් නිලධාරියෙකුගෙන් තවත් නිලධාරයෙකු වෙත භාර දෙනු ලැබූ වහාමද හා වාහනයේ රියදුරන් මාරුවූ විටද, එවැනිම සමීක්ෂණයක් පැවැතුවූ බව තහවුරු කිරීමේ සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**(ආ) භාණ්ඩාගාර චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | 105,000 | ලබාදිය හැකි සීමාව රු.5,000 කින් ඉක්මවා තත් කාර්ය අතුරු අග්‍රිම ලබා දී තිබුණි. |

**(ඇ) අනෙකුත් චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| (i) 2016 ජනවාරි 12 දිනැති අංක 1/2013 හා 1/2016 දරන සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධක අමාත්‍යාංශයේ චක්‍රලේඛ | - | ප්‍රා දේශීය ලේකම් කාර්යාල 04 ක කමිටු අනුමැතියක් ලබා නොගෙන මාස 03 ක දීමනා නොගැනීම මත අවස්ථා 230 කට අදාළව ගෙවීම් ලේඛනයෙන් නම් ඉවත් කර තිබුණි. |
| (ii) 2016 ජුනි 29 දිනැති අංක 2014/7 (පළමු එකතුව) දරන දිවිනැගුම චක්‍රලේඛය හා 2016 සැප්තැම්බර් 08 දිනැති අංක DDD/HO/05/MF/05/02 දරන දිවිනැගුම අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | - | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක ප්‍රජාමූල බැංකු 35 ක් විසින් දිවිනැගුම අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතු වාර්තා 420 ක් අතරින් නියමිත දිනට වාර්තා 190ක් පමණක් එවා තිබුණි. එමෙන්ම ලබාදී තිබූ වාර්තා අතරින් 2016 දෙසැම්බර් 31 දින වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අදාළ දිවිනැගුම ප්‍රජාමූල බැංකු 09 ක ශේෂ පිරික්සුම තුලනය කර නොතිබුණි. |
| (iii) 2016 ජුනි 29 දිනැති අංක 7/2014(පළමු එකතුව) දරන දිවිනැගුම චක්‍රලේඛය | - | දිවිනැගුම ප්‍රජාමූල බැංකු මගින් දිවිනැගුම ප්‍රතිලාභීන් වෙත නිකුත් කරන ණය පිළිබඳ සමස්ථ ක්‍රියාවලිය දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභයන්තර විගණන අංශය විසින් අඛන්ඩව අධික්ෂණය කළ යුතු වුවද, බංගලාහත බැංකුවේ ලොග් පොත පරික්ෂා කිරීමේදී විගණන කටයුතු සඳහා 2015 වර්ෂයේ සිය විගණිත දිනය වූ 2016 නොවැම්බර් 04 දින දක්වා අවස්ථා 06 කදී පමණක් දිවිනැගුම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන නිලධාරින් පැමිණ තිබුණි. |

**3.8 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ නොකිරීමට හේතු |
|---|---|---|---|
| | | රු. | |
| (i) | කුරුදුඔය ඇල්මා ග්‍රේමන්ඩ් පඩිපෙළ සකස් කිරීම | 200,000 | ගම්වාසීන් විසින් ඇල්මා ග්‍රේමන්ඩ් මාර්ගය සංවර්ධනය කරන ලෙස ඉල්ලා සිටීම. |
| (ii) | ඉහළ පන්නල කොටස ජල සැපයුම | 250,080 | ජල මූලාශ්‍රය මගින් පෝෂණය වන සේරුපිටිය වෙල්යායට ජලය නොලැබීම මත මහජනතාව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට විරුද්ධ වීම. |
| (iii) | කන්දෙයාය නළ ළිං 02 ක් ඉදිකිරීම. | ඇස්තමේන්තු කර නැත. | ප්‍රතිපාදන මුදල ප්‍රමාණවත් නොවීම. |
| (iv) | ඩෙල්මාර් පහළ කොටස ජල සැපයුම | -එම- | - එම - |

**(ආ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | නිම කළ දිනය | 2016 දෙසැම්බර් 31 දින වන විට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|---|
| | | රු. | | | | රු. | |
| (i) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය මාණ්ඩලික රජයේ නිවාසය | 7,256,180 | 2016.02.12 | 16.05.12 | 2016.10.30 | 6,142,859 | වර්ෂාව හා සැලැසුම් ලබාදීම ප්‍රමාද වීම. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (ii) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තීන්ත ආලේප කිරීම | 5,083,288 | 2016.08.08 | 2016.12.20 | වැඩ අවසන් කර නැත | 3,209,177 | සැලැසුම් කිරීමේ දෝෂ පැවතීම හා වර්ෂාව |
| (iii) | ඇල්බියන් පැති බැම්ම ඉදිකිරීම | 2,657,323 | 2016.07.05 | 2016.10.05 | 2016.12.10 | 2,294,440 | වර්ෂාව |
| (iv) | බටගොල්ල පුස්සදේව ද්විතීයික පාසලේ ක්‍රීඩාංගණය සංවර්ධනය | 2,757,464 | 2015.10.23 | 2015.12.15 | 2016.10.31 | 719,341 | වර්ෂාව හා කොන්ත්‍රාත්කරු නියමිත දිනට වැඩ අවසන් කිරීමට උත්සාහ නොකිරීම. |
| (v) | මඩුල්ල ද්විතීයික පාසලේ ක්‍රීඩාංගණය සංවර්ධනය | 6,538,270 | 2015.10.25 | 2015.12.15 | 2016.10.31 | 2,655,162 | වර්ෂාව හා කොන්ත්‍රාත්කරු නියමිත දිනට වැඩ අවසන් කිරීමට උත්සාහ නොකිරීම. |
| (vi) | සාද නිවාසය ඉදිකිරීම - කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 6,102,719 | 2016.11.07 | 2016.12.20 | වැඩ අවසන් කර නැත | 2,809,162 | සැලැසුම් ලබාදීම ප්‍රමාද වීම හා කොන්ත්‍රාත් පිරිනැමීමට ප්‍රමාද වීම. |
| (vii) | ගණකාධිකාරී නිල නිවස ඉදිකිරීම - වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 4,716,000 | 2015.12.18 | 2015.12.31 | 2016.12.31 | 5,556,064 | සැලැසුම් ලබාදීම ප්‍රමාද වීම.<br><br>කොන්ත්‍රාත් පිරිනැම්මට ප්‍රමාද වීම. |
| (viii) | හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිකිරීම | 26,664,581 | 2016.08.04 | 2016.12.20 | වැඩ අවසන් කර නැත | 12,916,413 | සැලැසුම් ලබාදීම ප්‍රමාද වීම. |

**(ඇ) මුදල් නිදහස් කර තිබුණද, අරමුණු ඉටු කර නොතිබුණු ව්‍යාපෘති**

**-----------------------------------------------------------------**

ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සංචාරක නිවාසය අළුත්වැඩියාව සඳහා රු.1,694,655ක් වියදම් කර තිබුණද, 2017 මැයි 02 දින විගණන පරීක්ෂාව සිදු කරන අවස්ථාව වන විටත් එම

කර්මාන්තයට අදාළ වැඩ කටයුතු ඉටු කර අවසන් කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඇස්තමේන්තු අංක 60 සිට 69 දක්වා වූ වැඩ ඉටු කර නොතිබියදී ඒ සඳහා රු.56,020 ක් ගෙවා තිබුණි.

(ii) අළුත්වැඩියාව සිදු කරන ලද නාන කාමර දෙකෙහි ටයිල් කැටවල නිමාව සතුටුදායක තත්ත්වයක නොතිබුණි.

(iii) 2017 මැයි 02 දින වන විටත් ගෙවීම් කරන ලද චෙක්පත ගෙවීම්ලාභියා වෙත ලබා නොදී අත රඳවාගෙන තිබුණි.

(iv) ඉංජිනේරුවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව රාජ්‍ය පරිපාලන නව රජයේ නිවාඩු නිකේතනයේ අළුත්වැඩියාව සඳහා, කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද රු.345,523 ක බිල්පත සඳහා ගෙවීම් කර තිබුණි.

**(ඇ) අවිධිමත් ලෙස ඉටුකර තිබුණු ව්‍යාපෘති**

**-------------------------------------------**

නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තීන්ත ආලේප කිරීමේ කොන්ත්‍රාත්තුවේ අවසාන බිල්පත අනුව ඇස්තමේන්තුවේ සඳහන් එකතුව රු.1,939,084ක් වූ වැඩ කොටස් ඉටු කර නොතිබුණි. එකතුව රු.1,579,535 ක් අමතර වැඩ ලෙස දක්වා වෙනත් වැඩ කටයුතු වෙනුවෙන් ගෙවීම් කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු පරිදි ඉටු කළ යුතු වැඩ අවසන් කිරීමෙන් තොරව ඒ කොන්ත්‍රාත්තුව නිම කිරීමට ප්‍රමාණවත් නොවන බව හා ඒ වෙනුවට අමතර වැඩ ඉටු කළ බව සඳහන් කර ගෙවීම් කර තිබුණි. නමුත් එලෙස ඉටු නොකළ වැඩ සඳහා නැවත 2017 වර්ෂයේදී එකතුව රු.1,966,943 ක ඇස්තමේන්තුවක් සකස් කර කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

**3.9 කාර්යසාධනය**

**----------------**

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය මගින් ක්‍රියාත්මක කරන ලද වැවන්ඩන් වත්තේ ගල් පෙරලීමේ ආපදාවෙන් අවතැන් වූවන් නැවත පදිංචි කළ ප්‍රදේශයේ පැති බැම්ම හා කාණු සකස් කිරීම් කර්මාන්ත සඳහා රු.6,978,442ක් වූ ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.3,834,931 ක් හෙවත් සියයට 55ක් පමණක් වැය කර තිබුණි.

(ආ) විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ව්‍යාපෘති 08 ක්, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති 01 ක්, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන විශේෂ වැඩසටහන යටතේ ව්‍යාපෘති 06 ක්, ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ (2015 අවිච්ඡේද) ව්‍යාපෘති 01 ක් හා කඳුරට නව ගම්මාන සහ යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශ යටතේ ව්‍යාපෘති 02 ක් වශයෙන් ව්‍යාපෘති 18 ක් ක්‍රියාත්මක නොකර හෝ අර්ධ වශයෙන් නිමකර තිබුණි.

(ඇ) අභ්‍යන්තර විගණන ඒකකය 2015 වර්ෂයේ කාර්යාල දින 58 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක විගණන කටයුතු සිදුකර තිබුණද, 2016 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විගණන කටයුතු කාර්යාල දින 43 කදි පමණක් ඉටුකර තිබුණි.

## 3.10 අවිධිමත් ගනුදෙනු

--------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අවිධිමත් ලෙස ගනුදෙනු සඳහා එළඹ තිබුණු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැර වීම

------------------------------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණයේදී පහත සඳහන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පටිපාටින්යෙන් බැහැරව වූ අවස්ථාවන් නිරීක්ෂණය විය.

(i) ප්‍රසම්පාදන කමිටුව ප්‍රසම්පාදන පිරිනැමීමට අවශ්‍ය ආයතනයට ප්‍රසම්පාදන පිරිනැමිය හැකි අයුරින් ලංසු ලේඛනවල සියළු ලංසු ඇගයීම් නොකර ප්‍රසම්පාදන තීරණ 04 ක් ගෙන තිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.2 මාර්ගෝපදේශය ලංසු භාර ගන්නා අවසාන දිනට පසුව ලද ලංසු ප්‍රසම්පාදන තීරණ අනුව ලබාගැනීම සඳහා වලංගු ලංසු ලෙස සැලකිය නොහැකි වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2 ක් විසින් ලංසුව වැසීමෙන් පසු ඉදිරිපත් කළ ලංසුද ප්‍රසම්පාදන තීරණ සඳහා සලකා බැලූ අවස්ථා 03 ක් පැවැතුණි.

(iii) කොත්මලේ හා අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2 ක ප්‍රසම්පාදන කමිටු රැස්වීම් සඳහා සහභාගී වූ නිලධාරීන් ප්‍රසම්පාදන තීරණ සඳහා අත්සන් යොදා නොතිබුණු අවස්ථා 23 ක් විය.

(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3(ඇ) මාර්ගෝපදේශය අනුව යම් ආයතනයක පූර්ව සේවය හෝ සැපයීම අනුව එම ආයතනවලින් නැවත මිලදී ගැනීමක් සිදු නොකිරීමට ආයතනය තීරණය කර ඇත්නම්, එම ආයතනය වෙත ලංසු ආරාධනා නොයැවිය යුතු වුවද, ඉදිරිපත් කළ ලංසු විවිධ හේතු මත ඇගයීම් නොකළ අවස්ථා 05 ක් පැවතුණි.

(v) අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ලියාපදිංචි තැපෑලෙන් / මුද්‍රා යෙදූ මිල ගණන් ලබා ගැනීම වෙනුවට අවස්ථා 12 කදී අතින් මිල ගණන් ලබා ගෙන තිබුණි.

(vi) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව සුදුසුකම් ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා සහභාගි වීම සඳහා සාධාරණ සමාන හා උපරිම අවස්ථා ලබාදෙමින් ජාතික තරඟකාරී ලංසු කැඳවීමක් සිදුකළ යුතුව තිබුණි. ඉන් බැහැරව 2001 වර්ෂයේ සිට 2103 වර්ෂය දක්වා ප්‍රාග්ධන වැය විෂයන් සඳහා සලසාදී තිබූ එකතුව රු. 22,500,000 ක ප්‍රතිපාදනවලින් සිදු කරන ලද ප්‍රසම්පාදන කටයුතු 2016 පෙබරවාරි මාසයේ සිට අප්‍රේල් මාසය දක්වා කාලය තුළ ආරම්භ කර වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමයෙන් සිදු කිරීමට අපේක්ෂිත බව ප්‍රසම්පාදන සැලැස්මේ දක්වා තිබුණි.

(vii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2:14:1 මාර්ගෝපදේශය අනුගමනය නොකර දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය පවිත්‍රතා කටයුතු සඳහා ආයතන 02කින් පමණක් ලංසු කැඳවා රු.3,300,000 ක ගිවිසුමකට එළඹ තිබුණි. අවම මිල ඉදිරිපත්

කරන ලද ආයතනය ගිවිසුම් කොන්දේසිවලට එකඟ නොවීම හේතුවෙන් නැවත ලංසු කැඳවීමකින් තොරව දෙවන සැපයුම්කරුට රු.324,000 ක් වැඩියෙන් කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

(viii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14:1 මාර්ගෝපදේශය ප්‍රකාරව අවම වශයෙන් මුද්‍රා තැබූ ලංසු 03 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් ප්‍රසම්පාදන තීරණයකට එළඹිය යුතු අතර, එසේ ලංසු ඉදිරිපත් නොවූ අවස්ථාවක නැවත ලංසු කැඳවිය යුතු වුවද, එම නියමයන්ගෙන් බැහැරව ප්‍රසම්පාදන තීරණ 13 කට එළඹ තිබුණි.

(ix) නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තීන්ත ආලේපය කිරීමේ කොන්ත්‍රාත්තුවේදී ඇතුළත බිත්තිවල පොටි යෙදීම හා ප්‍රයිමර් ආලේපය සඳහා ඇස්තමේන්තු කර නොතිබුණි. නමුත් මුළු ඇස්තමේන්තුවෙන් සියයට 22 ක් අමතර වැඩ ලෙස යොදා රු.1,138,085 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 මාර්ගෝපදේශය ප්‍රකාරව සියයට 10 ට වැඩි කොන්ත්‍රාත් විචලනයක් සඳහා ලබාගත යුතු අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

**(ආ) වෙනත්**

---------

ව්‍යාපෘති 03 ක් සඳහා 2014 දෙසැම්බර් 31 දින වන විට රු. 622,623 ක චෙක්පත් නිකුත් කර, එම මුදල් පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. 2016 ඔක්තෝබර් මාසය වන විටද එම ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

**(ඇ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

------------------------------------

වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වර්ෂයකට වැඩිහිටියන් 3000 ක් වෙත දීමනා ගෙවීම් කර තිබුණද, ඒ සඳහා වන අයදුම් පත්‍ර 2000 ක් පමණක් ලැබී තිබුණි. ඒ අනුව අයදුම්පත්‍රයක් හෝ නොමැතිව වැඩිහිටියන් දහසකට මසකට රු.2,000,000 ක් ගෙවීම් කර තිබුණි.

**3.11 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

-----------------------------------------

වාහන දෙකකට අදාළව කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වා තිබූ ඉන්ධන ලේඛනය, දෛනික ධාවන සටහන් සමඟ සැසඳීමේදී ඉන්ධන ලේඛනය අනුව ලබාගත් රු.36,468 ක ඉන්ධන ලීටර් 383.87 ක් දෛනික ධාවන සටහනට ඇතුළත් කිරීමෙන් තොරව රථයවලට ඉන්ධන යෙදූ බවට සාවද්‍ය බිල්පත් ඉදිරිපත් කර මුදල් ලබාගෙන තිබුණි.

**3.12 පාඩු හා හානි**

--------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ). හානිය සිදුවී වර්ෂ 10 ඉක්මවූ රථවාහන අනතුරු 2 ක අලාභය වූ රු.137,050 ක් ද වර්ෂ 5 ක සිට 10 ක් දක්වා කාලපරාසයක් තුළ වූ රු.320,150 ක අනතුරු 5 ක අලාභයද, මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ පවත්වා පොත්වලින් කපා හැරීමට හෝ වගකිව යුත්තන්ගෙන් අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ). 1994 මැයි 23 දින කච්චේරි ගොඩනැගිල්ල ගින්නෙන් විනාශ වීම සම්බන්ධයෙන් වර්ෂ 22 ක් හානියේ නිවැරදි තක්සේරුවක් ලබාගැනීමට නොහැකිව පැවතුණු අතර, එය ගිණුම්වලින්ද අනාවරණය කර නොතිබුණි.

(ඇ). මැටිබැඹිය ආලෝක බැද්ද මහා විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය සඳහා 2015 වර්ෂයේදී රු.980,000 ක් වැයකර තිබුණි. ඉදිකර තිබූ කොන්ක්‍රීට් බැම්ම කඩා වැටී තිබුණු අතර, 2017 මාර්තු මාසය වන විටත් නැවත සකස් කර නොතිබුණු අතර, මුදල් රෙගුලාසි 104 පරීක්ෂණ සිදුකර වගකිව යුත්තන් හඳුනාගෙනද නොතිබුණි.

## 3.13 විසඳා නොතිබුණු විගණන ඡේද

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිවැරදි කිරීම් සිදු කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2012 | 1.8.(අ)VII | අවිධිමත් ගනුදෙනු |
| 2013 | 1.7. (අ) I, II | වත්කම් කළමනාකරණය |
| | 1.7 (ඇ) | වත්කම් කළමනාකරණය |
| | 1.8(අ) V. II | අනුකූල නොවීම් |
| | 1,14 .III | කළමනාකරණ දුර්වලතා |
| 2014 | 3.8 | වත්කම් කළමනාකරණය |
| | 3.9 | අනුකූල නොවීම්. |
| | 3.11 | අවිධිමත් ගනුදෙනු |
| | 3.14 | කළමනාකරණ දුර්වලතා |
| 2015 | 3.1 සිට 3.14 | අවිධිමත් ගනුදෙනු,<br>වත්කම් කළමනාකරණය,<br>අනුකූල නොවීම්,<br>කළමනාකරණ දුර්වලතා. |

## 3.14 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් කළමනාකරණ දුර්වලතාවන් නිරීක්ෂණය විය.

(අ) කොත්මලේ, නුවරඑළිය, වලපනේ හා හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2016 වර්ෂයේ රම්බොඩ ග්‍රාම නිලධාරී වසමේ සිදුවූ නිවාස හානි වෙනුවෙන් 2016 මාර්තු 31 දිනැති අංක දි.ලේ.නු/05/10/02/10 දරන දිස්ත්‍රික් ලේකම්ගේ ලිපියෙන් නිවාස 13 ක් වෙනුවෙන් රු.390,000 ක ආධාර එවා තිබුණි. විගණන දිනය වූ 2016 සැප්තැම්බර් 07 දින වන විටත් එම මුදල අදාළ ප්‍රතිලාභීන්ට ලබා දීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2016 ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා කාලය තුළ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් 72 ක් තුළ දරුවන් 8675 දෙනෙකුගෙන් සමන්විත පෙර පාසල් 298 ක් ක්‍රියාත්මක වී තිබුණි. නැවුම් කිරි වීදුරුවක් ලබාදීමේ වැඩසටහන ග්‍රාම නිලධාරී වසම් 16 ක පෙර පාසැල් 22 ක පමණක් ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව ප්‍රතිලාභය ලැබූ දරුවන් සංඛ්‍යාව 456 ක් වූ අතර කොට්ඨාශයේ පෙර පාසල් දරුවන්ගෙන් සියයට 95 කට පමණ එම ප්‍රතිලාභය අහිමිවී තිබුණි.

(ඈ) කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ලියාපදිංචි පෙර පාසල් 85 ක් හා පෙර පාසල් හා වතු ළමා සංවර්ධන මධ්‍යස්ථාන 115 ක් පවතින අතර දරුවන් 1900 ක් ලියාපදිංචිව සිටී. මෙම දරුවන්ගෙන් සියයට 73 ක් නැවුම් කිරි වීදුරුවක් ලබාදීමේ වැඩ සටහන මඟින් ආවරණය වී නොතිබුණි.

(ඉ) 2016 වර්ෂයේදී ලියන ලද රු.464,581 ක් වටිනා චෙක්පත් 07 ක් ආදායකයා වෙත භාරදීමට කටයුතු නොකර 2017 මාර්තු 14 දින වන විටත් අත රඳවාගෙන තිබුණි.

(ඊ) 2015 ජූනි 11 දිනැති අංක 2015/06/01 දරන දිවිනැගුම සහනාධාර චක්‍රලේඛය ප්‍රකාරව සහනාධාර සඳහා වෙන්කරන අක්මුදල් එම කටයුත්ත සඳහා පමණක් යොදා ගත වුවත්, නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිවිනැගුම ප්‍රජාමූල බැංකු වෙත ප්‍රධාන කාර්යාලයෙන් ලැබෙන මුදල් 2016 වර්ෂයේදී දිවිනැගුම සහනාධාරලාභීන්ගේ ගිණුම්වලට බැර කිරීමට දින 30 ක සිට දින 107 ක් දක්වා කාල පරාසයක් ප්‍රමාද කර තිබූ අවස්ථා 114 ක් පැවතුණි. නියමිත දිනට ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට මුදල් බැර නොකිරීම නිසා ප්‍රතිලාභීන්ට රු.1,421,781 ක පොලී මුදලක් උපයාගැනීමේ හැකියාව අහිමිවී තිබුණි.

(උ) සහනාධාර මුදල් දිවිනැගුම දෙපාර්තමේන්තුවෙන් බැංකුව වෙත ප්‍රේෂණය කිරීමට පෙර බැංකු 03 ක් විසින් අවස්ථා 04 කදී සහනාධාරලාභීන්ගේ ගිණුම් වෙත රු.8,128,350 ක මුදල් බැර කර තිබුණි.

(ඌ) 2015 ජූනි 11 දිනැති අංක 2015/06/01 දරන දිවිනැගුම සහනාධාර චක්‍රලේඛයේ 4.4 ඡේදය අනුව සහනාධාර සඳහා වෙන් කරන අක්මුදල් එම කටයුත්ත සඳහා පමණක් යොදාගෙන අදාල ගෙවීම් නිසි පරිදි අවසන් කිරීම දිවිනැගුම අංශ සියලු නිලධාරීන්ගේ වගකීම වුවද, ඇතැම් බැංකු විසින් ලැබෙන සහනාධාර මුදල් සහනාධාර ලාභීන්ගේ ගිණුම් වෙත බැර කිරීම මාස 01 ක සිට මාස 04 ක් දක්වා ප්‍රමාද කිරීම නිසා සහනාධාර මුදල් රු.264,758,670 ක ප්‍රමාණයක් බැංකු තුළ මාසයකට වැඩි කාලයක් රඳවාගෙන තිබුණි.

(එ) 2015 මැයි 20 දිනැති අංක 11/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ නියමයන්ගෙන් පරිබාහිරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටු 19 ක් බදාදා දිනයන්හි කාර්යාල වේලාව තුළ පවත්වා තිබුණි.

**3.15** **මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව සහ තථ්‍ය සේවක සංඛ්‍යාව**

**-------------------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 34 | 25 | 09 | - |
| (ii) | තෘතියික මට්ටම | 20 | 11 | 09 | - |
| (iii) | ද්විතියික මට්ටම | 942 | 778 | 166 | 02 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 87 | 73 | 17 | 03 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 02 | - | 02 |
| | **එකතුව** | **1083** | **889** | **201** | **07** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් අනුමත කාර්ය මණ්ඩලය අනුව කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්, සහකාර අධ්‍යක්ෂ (සැලැසුම්) හා පරිපාලන නිලධාරී යන මාණ්ඩලික නිලධාරී තනතුරු 3 ම පුරප්පාඩුවී පැවතීම කාර්යාලයේ කාර්යසාධනය කෙරෙහි සෘජුවම බලපා තිබුණි.

(ආ) මධ්‍යම රජයේ සමාජ සේවා නිලධාරී, වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරී තනතුරු පුරප්පාඩු වී පැවතීම අංශයේ කටයුතු කරගෙන යෑමට බාධාවක්වී පැවතුණි.